# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2005/15 – 2017 පෙබරවාරි 08 වැනි බදාදා – 2017.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2017 අංක 35 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/5/2016/එච්/471.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: එන්/ඩීඑස්/එල්/බීඑච්එන්ටීආර්/2016.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2017 ජනවාරි මස 30 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, නින්දවූර්.

2. **ඉඩමේ විස්තරය.–** නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, නින්දවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නින්දවූර් පත්තු සුළු කොට්ඨාසයේ නින්දවූර් ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක. ඒඑම්/එන්අයිඑන්/2016/358 සහ 2016.11.08 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 2.2150 ක් පමණ වන කොකඩ්ඩි ඉලවසම් නමැති ඉඩම් කොටස් තුනට (03) මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කොකඩ්ඩි ඉලවසම්– ප්‍රමාණය: හෙක්. 0.1911 ක් පමණ**
උතුරට: අබූබක්කාර් මරෙක්කාර් සහ ඒ. එල්. ශාපිර් හිමිකම් කියන කොකඩ්ඩි ඉලවසම්; නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.); දකුණට: කැබලි අක්ෂර බී සහ ඩී ; බටහිරට: එම්. එච්. එම්. යකුබ් හසාන් හිමිකම් කියන කොකඩ්ඩි ඉලවසම්.

02. **කැබලි අක්ෂර 'බී' – කොකඩ්ඩි ඉලවසම්– ප්‍රමාණය: හෙක්. 1.2145**
උතුරට: කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.); දකුණට: එස්. එම්. බුහාරි, එම්. එල්. අච්චි මොහාමද් සහ එම්. එන්. නහුර් හිමිකම් කියන කොකඩ්ඩි ඉලවසම්; බටහිරට: අච්චි මොහාමද් සහ එම්. එන්. නහුර් හිමිකම් කියන කොකඩ්ඩි ඉලවසම් සහ කැබලි අක්ෂර ඩී.

03. **කැබලි අක්ෂර 'ඩී' – කොකඩ්ඩි ඉලවසම්– ප්‍රමාණය: හෙක්. 0.8094**
උතුරට: කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: කැබලි අක්ෂර බී; දකුණට: එම්. එල්. අච්චි මොහාමද්, එම්. එන්. නහුර්, එච්. එම්. කබීර් සහ ඔහුගේ බිරිඳ හිමිකම් කියන කොකඩ්ඩි ඉලවසම්; බටහිරට: එම්. එච්. යකුබ් හසාන් හිමිකම් කියන කොකඩ්ඩි ඉලවසම්.

02 - 853


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.